ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**අප්‍රේල් 2018**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 අප්‍රේල් මාසයේදී 45.5 ක දර්ශක අගයක් වාර්තා කරමින් මාර්තු මාසයට සාපේක්ෂව දර්ශක අගයන් 20.1 කින් පහත වැටුණි. පෙර වසරවලදී ද පැවැති ප්‍රවණතාවයට අනුකූලව, මාර්තු මාසයේ දී ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ නිෂ්පාදන ක්‍රියාකාරකම් අප්‍රේල් මාසයේ දී අලුත් අවුරුදු නිවාඩු හේතුවෙන් පසුගාමී විය. මෙලෙස නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ පහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන් නිෂ්පාදන සහ නව ඇණවුම් උප දර්ශක පහත වැටීම හේතු විය. ගැනුම් තොග සහ සේවා නියුක්ති උප දර්ශක ද අප්‍රේල් මාසයේ දී පහත වැටුණි. තවද, සැපයුම්කරුවන්ගේ අඩු කාර්යබහුලත්වය පිළිබිඹු කරමින් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකයේ ඉහළ යෑම අඩු විය. අවුරුදු නිවාඩුවෙන් පසු සේවකයන්, අනුමැතියකින් තොරව සේවයට වාර්තා නොකිරීම නිෂ්පාදන ක්‍රියාවලියට බාධාවක් බව මෙම සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දක්වන්නන්ගේ අදහස විය. තවද, විශේෂයෙන් රෙදිපිළි හා ඇඟළුම් අංශයේ ප්‍රතිචාර දක්වන්නන් පුහුණු සහ නුපුහුණු සේවකයන් සොයා ගැනීමේ ඇති අපහසුතාවය ඉස්මතු කරන ලදී. එනමුදු, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 මාර්තු මාසයේ දී වාර්තා වූ 58.0 ක දර්ශක අගයට සාපේක්ෂව අප්‍රේල් මාසයේ දී 53.2 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයේ සිදු වූ අඩු වීමත් සමඟ, සේවා අංශය අඩු වේගයකින් වර්ධනය වූ අතර 2018 අප්‍රේල් මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය ආරම්භයේ සිට වාර්තා වූ පහළම අගය වාර්තා කළේය. පසුගිය වසර දෙකෙහි දී දක්නට ලැබුණු පරිදි ද, මාර්තු මාසයට සාපේක්ෂව අප්‍රේල් මාසයේ දී, සේවා අංශය සාමාන්‍යයෙන් අඩු වර්ධනයක් පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන්, දේපල වෙළඳාම, සන්නිවේදනය සහ නවාතැන් හා ආහාරපාන සැපයීම යන අංශවල නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයේ අඩු වීමක් දක්නට හැකි විය. සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන ඇතැම් ප්‍රතිචාර දක්වන්නන්, 2018 අප්‍රේල් මාසයේ පැවති වැඩි නිවාඩු දින ගණන මෙයට හේතු ලෙස සඳහන් කර තිබුණි. පසුගිය මාස දෙකෙහි දී දක්නට ලැබුණු උපනතිය අඛණ්ඩව ඉදිරියට ගෙනයමින්, නිම කිරීමට ඇති කාර්යයන් පහළ ගිය අතර පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් සේවා නියුක්තිය ද පහළ ගියේය. කෙසේ වුවද, සුබවාදී කෙටි කාලීන ව්‍යාපාර අපේක්ෂා පිළිබිඹු කරමින් අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනය ඉහළ මට්ටමක පැවතුණි. උත්සව සමයේ ඇතිවන ඉල්ලුම් ප්‍රවණතා, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, ඉන්ධන සඳහා වන මිල සූත්‍රය පිළිබඳ අපේක්ෂා සහ බදු ව්‍යුහයෙහි මත කාලීනව සිදු වූ සංශෝධන හේතුවෙන් සේවා අංශයේ අය කරන මිල ගණන් ඉහළ ගියේය. මේ අතර, ඇතැම් සමාගම්වල 2018 අප්‍රේල් මාසයේ දී සිදු වීමට නියමිතව තිබූ වැටුප් වර්ධන සිදු වීම හේතුවෙන් අපේක්ෂිත ශ්‍රම පිරිවැය අඩු වේගයකින් ඉහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | **2018** | 51.7 | 55.6 | 65.6 | **45.5** | - | - | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | **2018** | 56.6 | 58.4 | 58.0 | **53.2** | - | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.